**කින්නියා ප්‍රාදේශීය සභාව - 2023**

**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කින්නියා ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කින්නියා ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතයවේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි

හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් 1.6.1 (ඈ) සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචි වර්ෂයේදී කිරි අලෙවි සැලට සභාව විසින් මිලදි ගත් රු. 4,883,800 වටිනා යන්ත්‍ර සහ ඒ හා සම්බන්ධ උපකරණ 07 ක්, පුටු 32 ක් හා මේස 08 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | පිළිතුරු සපයා නැත. | සමාලෝචි වර්ෂයේදී මිලදි ගත් වත්කම් මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් කල යුතුය. |
| (ආ) | ප්‍රාදේශිය සංවර්ධන සහායක ව්‍යාපෘති යටතේ රු. 19,195,229 වියදමින් ඉදිකර සමාලෝචිත වර්ෂයේදී නිමකරන ලද වෙළඳ පොළ සංකීරණයේ වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල රු. 16,034,269 ලෙස දක්වා තිබුණි. | පිළිතුරු සපයා නැත. | වෙළඳ පොළ සංකීරණයේ සත්‍ය වටිනාකම් මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් කල යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන තුලනය කිරීම සඳහා සමුච්චිත අරමුදල් ගිණුමට හර කරන ලද රු. 1,884,613 ක හඳුනා නොගත් ශේෂය හඳුනාගෙන නිවැරදි කර නොතිබුණි. | පිළිතුරු සපයා නැත. | හේතු හඳුනා ගෙන නිවැරදි කළ යුතුය. |
| (ඈ) | 2021 හා 2022 වර්ෂ සඳහා විදුලි බල මණ්ඩලය වෙත ගෙවිය යුතු වීදි ලාම්පු සඳහා වන විදුලි බිල රු. 1,002,528 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | පිළිතුරු සපයා නැත. | ශේෂපත්‍රයේ ගෙවිය යුතු ලෙස පෙන්නුම් කළ යුතුයි. |
| (ඉ) | 2021 වර්ෂයේ මිලදි ගන්නා ලද රු. 199,500 වටිනා නිරීක්ෂණ කැමරා වල වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ ඉදිරියට ගෙන ගෙනවිත් නොතිබුණි. තවද, මෙම නිරීක්ෂණ කැමරා භෞතික ලෙස සභාවේ නොතිබීම සඳහන් කල යුතුය. | පිළිතුරු සපයා නැත. | නිරීක්ෂණ කැමරා වත්කම් වලට ඇතුළත් කළ යුතුයි. |

### 1.6.2 නොසැසඳු වෙනස්කම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂ අවසානයට ණයහිමි ශේෂය හා ලේඛනවල ඇති අනුරූපි | පිළිතුරු සපයා නැත. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කළ යුතුය. |

ශේෂයන් අතර රු. 2,384,918 ක වෙනසක් පැවතුණි.

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථාවර වත්කම් එකතු වටිනාකම රු. 29,879,572 ක් වූ ගිණුම් අයිතම 04 කට අදාළ සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ඔබ විසින් පෙන්වා දී ඇති ලියවිලි ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | ලේඛන ලබා ගැනීමට පියවර ගත යුතුය |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ------------------ | -------------------- | ------------------------ | ------------------ |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 571 (1), (2), (3) | වර්ෂ දෙකකට වැඩි රු. 2,860,360 ක කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් සභාව අදාළ පුද්ගලයින්ට ආපසු ලබා දීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් නිසි කටයුතු සිදුවෙමින් පවති. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නිසි කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ 31 දෙසැම්බර් 2023 .පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු. 7,753,225 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු. 4,257,574 ක් විය .

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තු ගත ආදායම | 2023 බිල්කල ආදායම | 2023 රැස්කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිගය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | 2022 බිල්කල ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | - | - | - | - | 50,000 | - | - | - |
| (ii) | කුලී | 8,375,000 | 14,757,000 | 5,154,000 | 9,603,000 | 8,475,000 | 8,475,000 | 3,034,000 | 7,382,000 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,645,000 | 3,245,000 | 1,118,000 | 2,127,000 | 1,740,000 | 1,740,000 | 1,140,000 | 600,000 |
| (iv) | වෙනත් ආදායම් | 22,112,000 | 22,112,000 | 3,081,000 | 7,382,000 | 24,357,000 | 24,357,000 | 11,255,000 | 7,382,000 |
| | එකතුව | 33,141,000 | 40,114,000 | 9,353,000 | 19,112,000 | 34,622,000 | 34,572,000 | 15,429,000 | 15,364,000 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **කුලී**<br>සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු. 7,382,901 ක ලැබියයුතු බදු කුලී හිඟය වර්ෂ 02 ත් වර්ෂ 05 ටත් අතර කාල පරාසයක පැවතුණි.. | හිඟ මුදල නිසි ලෙස පරීක්ෂාකර කර කපා හැරීමට සභාව තීරණය කර ඇත. | හිඟය සම්බන්ධයෙන් නිසි ක්‍රියා මාර්ග ගත යුතුයි. |

### 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකායර්ක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආරක්ෂිත තැන්පතු සහ ටෙන්ඩර් තැන්පතු ගිණුම්වල පැවැති රු. 2,528,013 ක තැම්පතු 38 පිළිබඳ අදාළ තැන්පතුකරුවන්ට නැවත ලබා දී නොමැති නමුත් තැන්පතු ලයිස්තුවෙන් එම අදාල මුදල අනුමැතියකින් තොරව ඉවත්කර තිබුණි. | පිළිතුරු සපයා නැත. | තැන්පතු ගිණුම් සම්බන්ධයෙන් නිසි පරිදි ලේඛන පවත්වා ගත යුතුය. |
| (ආ) | 2022 වර්ෂයේ දී මිල දී ගන්නා ලද රු. 2,150,000 වටිනා කාබනික පොහොර නිෂ්පාදනය කරන යන්ත්‍ර 03 කාබනික පොහොර නිෂ්පාදනය ක්‍රියාවලිය සඳහා | පුද්ගලික හෝ සමිති මගින් මිල ගණන් කැඳවා පොහොර නිෂ්පාදනය ක්‍රියාකාරකම් සිදු කිරීමට කටයුතු කරගෙන යනු ලබයි. | පොහොර නිෂ්පාදන කිරීමට කටයුතු කළ යුතුය. |

යොදා ගැනීමට නිසි වැඩ පිළිවෙලක් ආරම්භ කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **3.2.1 නඩත්තු සහ අළුත්වැඩියාවන් සිදු නොකිරීම** | | |
| (අ) සභාව සතු වාහන 06 ක් අළුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ ඒවා වෙන්දේසියේ විකිණීමට වසර 19 අධික කාලයක් සභාව විසින් කටයුතු කර නොතිබුණි. | මෙම කරුණු සම්බන්ධයෙන් අප විසින් අඛණ්ඩව කටයුතු කරනු ලැබේ. | නිසි විකල්ප ක්‍රියාවලිය කඩිනම් කළ යුතුය. |
| **3.2.2 නිෂ්ක්‍රීය වත්කම්** | | |
| (අ) 2016 වර්ෂයේ රු. 897,155 ක වියදමින් උප්පාරු ප්‍රදේශයේ ඉදිකරන ලද විවිධ සේවා ගොඩනැගිල්ල වසර 08 ට අධික කාලයක් භාවිතා කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | සභාව විසින් පවරා ගෙන ඇති අතර මෙම කරුණු සම්බන්ධයෙන් අඛණ්ඩව කටයුතු කරනු ලැබේ. | ගොඩනැගිල්ල භාවිතා කිරීමට නිසි කටයුතු කළ යුතුය. |
| (ආ) 2022 වසරේ මිල දී ගන්නා ලද රු. 410,000 වටිනා කොහු නිෂ්පාදනය කරන යන්ත්‍රය කිසිදු භාවිතයකින් තොරව සභා ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණි. | පුද්ගලික හෝ සමිති මගින් මිල ගණන් කැඳවා පොහොර නිෂ්පාදනය ක්‍රියාකාරකම් සිදු කිරීමට කටයුතු කර ගෙන යනු ලබයි. | යන්ත්‍රය භාවිතා කර නිෂ්පාදනය කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 05 ක් සහ ද්විතීක මට්ටමේ පුරප්පාඩු 06 ක් සමග පුරප්පාඩු 11 ක් පිරවීමට කටයුතු නොකිරීම හේතුවෙන් සභාව විසින් මහජනතාවට සපයන සේවාවන් දුර්වලව පැවතුණි. | පුරප්පාඩු සම්බන්ධයෙන් අප විසින් අඛණ්ඩව කටයුතු කරනු ලබන අතර මේ වනවිට ද්විතීක මට්ටමේ පුරප්පාඩු සම්පූර්ණ කර ඇත. | නිරවුල් කිරීමට නිසි කටයුතු කළ යුතුයි. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 තිරසාර සංවධර්න ඉලක්ක

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත අනුව තිරසාර සංවර්ධන අරමුණු ලෙස ඉලක්ක හතරක් හඳුනාගෙන තිබු අතර, භෞතිකව ළඟා කර ගැනීමට හැකි වන පරිදි සැලැස්මක් සකස් කර නොමැත. | ඉලක්ක ළඟා කර ගැනීමට හැකි වන සැලැස්ම සකස් කරීම සඳහා අප විසින් කටයුතු කරනු ලැබේ. | තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා සැලැස්මක් සකස් කිරීමට පියවර ගත යුතුය |